## හෝමෝන කරල් තැන්පත් නොකළ යුතු ප්‍රධාන අවස්ථා මොනවාද?

- ලේ කැටි ගැසීමේ රෝග තත්ත්වයකින් පෙලෙන අවස්ථාවකදී
- පියයුරු හෝ අක්මා පිළිකා තත්ත්වයක් ඇති විටදී
- හේතුව සොයා නොගත් යෝනි රුධිර වහනයක් ඇති විට

## හෝමෝන කරල් තැන්පතුව නිසා ඇති විය හැකි ප්‍රධාන අතුරු ආබාධ මොනවාද?

- මාසික ඔසප් වීම අක්‍රමික වීම.

මෙය මුල් මාස කිහිපය තුළදී ක්‍රමයෙන් පහව යයි. එයින් හානියක් සිදු නොවේ. ඒ සදහා ප්‍රතිකාර අවශ්‍ය නොවේ. එසේ වුවත් රුධිර වහනය අධික නම් හෝ වැඩි කලක් පැවතුන හොත් ඒ සඳහා පහසුවෙන් ප්‍රතිකාර ලබා දිය හැකිය.

## නැවත සරුභාවයට පත්වීමට කොපමණ කාලයක් ගතවේද?

- නැවත සරුභාවයට ළඟාවීමේ කිසිදු ප්‍රමාදයක් ඇති නොවේ.
- පසු කාලීනව මඳසරුභාවයක් ඇති නොවේ.

## සේවා සැපයීම

- විශේෂ පුහුණුවක් ලද වෛද්‍ය නිලධාරියකු විසින් මෙය තැන්පත් කරනු ලබයි.

**හෝමෝන කරල් තැන්පතුව යනු ඉතා සාර්ථක, ආරක්ෂාකාරී සහ පහසුවෙන් භාවිතා කළ හැකි තාවකාලික පවුල් සැලසුම් ක්‍රමයකි.**



## වැඩිදුර උපදෙස් සඳහා හමුවන්න

- සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන්
- වෛද්‍ය නිළධාරීන්
- ලියාපදිංචි වෛද්‍ය නිළධාරීන්
- මහජන සෞඛ්‍ය හෙද සොහොයුරියන්
- පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියන්

**සුවසැරිය ✆ 1999**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ
සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රකාශනයකි

නිසි කල රිසි ලෙස
දරු සම්පත

# ප්‍රීතිමත් යුග දිවියක් උදෙසා...



# හෝමෝන කරල් තැන්පතුව

(ඉම්ප්ලාන්ට්)

## හෝමෝන කරල් තැන්පතුව

- ප්‍රොජෙස්ටජන් නම් ස්ත්‍රී හෝමෝනය අඩංගු පවුල් සැලසුම් ක්‍රමයකි.



තනි කරල් තැන්පතුව



කරල් දෙකේ තැන්පතුව

## ක්‍රියාකාරීත්වය

මෙය කිහිප ආකාරයකින් සිදුවේ

- ඩිම්බ (ස්ත්‍රී බීජ) මේරීම හා පිටවීම වැළැක්වීමෙන්
- ගැබ් ගෙල ශ්‍රාවයන්හි ඝනකම වැඩි කර ශුක්‍රාණු ගර්භාෂය තුළට ඇතුලුවීම අපහසු කිරීමෙන්

## හෝමෝන කරල් තැන්පතුව සුදුසු කාහටද?

- තාවකාලික පවුල් සැලසුම් ක්‍රමයක් දිගු කාලයක් භාවිතා කිරීමට අවශ්‍ය කාන්තාවකට
- කාන්තාවකට දරු ප්‍රසූතිය සිදුවූ වහාම

## හෝමෝන කරල් තැන්පත් කළ හැකි අවස්ථා මොනවාද?

තැන්පත් කරනු ලබන කරල් වර්ගය අනුව තැන්පත් කළ හැකි අවස්ථාව වෙනස් වේ

- කරල් දෙකේ තැන්පතුව නම් ඔසප්වීම පටන් ගෙන දින 7 ක් ඇතුළත ද,
- කරල් එකේ තැන්පතුව නම් ඔසප්වීම පටන් ගෙන දින 5 ක් ඇතුළත ද, තැන්පත් කරවා ගැනීම වඩාත් සුදුසුයි

## කරල් කොපමණ කලක් භාවිතා කළ හැකිද?

- තැන්පත් කළ කරල් වර්ගය අනුව භාවිතා කළ හැකි කාලය වෙනස් වේ.
    - කරල් දෙකේ තැන්පතුව නම් වසර 5 ක් ද,
    - කරල් එකේ තැන්පතුව නම් වසර 3 ක් ද භාවිතා කළ හැක
- නියමිත කාලය ඉකුත් වූ විගසම එම කරල් හෝ කරල ඉවත් කර අළුත් ඒවා තැන්පත් කර ගත හැකිය.

## හෝමෝන කරල් තැන්පත් කරන්නේ කෙසේද?

- මෙය ස්ත්‍රියකගේ උඩු බාහුවේ සමට යටින් තැන්පත් කරයි.
- මෙය තැන්පත් කිරීමට ගත වන්නේ විනාඩි 5 ක ටත් අඩු කාලයකි.



## හෝමෝන කරල ඉවත් කරන්නේ කෙසේද?

- නැවත දරුවෙක් අවශ්‍යයැයි සිතෙන ඕනෑම අවස්ථාවක මෙම කරල් ඉවත් කරවා ගත හැකිය.
- පවුල් සැලසුම් සායනයකදී මෙම කරල පහසුවෙන් ඉවත් කරවා ගත හැකිය.

මෙහි සාර්ථකත්වය
99% කටත් වඩා වැඩියි.

ඕනෑම වයස් සීමාවක කාන්තාවකට ආර්තවහරණය තෙක් භාවිතා කළ හැකිය.